**කැස්බෑව නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**----------------------**

1. මූල්‍ය ප්‍රකාශනය
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 06 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**----------------------------------------**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් රු. 433,514 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් රු. 24,760,013 ක ණය ශේෂය ජංගම වගකීමක් ලෙස ගිණුම්ගත නොකර ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ණයහිමි ශේෂය රු. 633,198 ක් වැඩියෙන් හා ස්ථාවර තැන්පත් පොලිය රු. 877,539 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) 2017 වර්ෂයේ මිලදීගත් රු. 1,728,410 ක් වටිනා පරිගණක, උපාංග සහ මෘදුකාංග, ලී බඩු හා සවිකිරීම් යටතේ ගිණුම්ගත කිරීම නිසා ලී බඩු හා සවිකිරීම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2017 වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) ලැබිය යුතු හිඟ ආදායම් ශේෂය වූ රු.1,490,777 ක් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ණයගැතියන් යටතේ ගිණුම්ගත නොකර විවිධ ණයගැතියන් යටතේ දක්වා තිබුණි.

**1.3.2 අසම්භාව්‍ය බැරකම්**
**-----------------------**

බාහිර පාර්ශවයන් විසින් නගර සභාවට එරෙහිව පවරා ඇති නඩු 11 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති නඩු 01 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු. 12,986,213 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

(i) 2016 දෙසැම්බර් 31 දිනට රථගාල බදු දීමෙන් අයවිය යුතු රු. 285,957 කින් හා විනෝද බදු රු. 298,497 කින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අය කර ගෙන නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට පොදු පහසුකම් මධ්‍යස්ථානයෙන් රු. 68,790 ක් අයවීමට තිබුණි.

(iii) 2009 සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ වීථි ආලෝක ආධාර රු. 481,578 ක් හා 2014, 2015 වර්ෂයන්ට අදාළව පිළියන්දල ක්‍රීඩා සමාජයෙන් ලැබිය යුතු විදුලි ගාස්තු රු. 111,054 ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

වර්ෂ ගණනාවක සිට පැවත එන නිරවුල් නොවූ ණයහිමි ශේෂය රු. 29,717,649 ක් විය.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

(අ) ස්ථාවර තැන්පත් සහතික, ඉතිරි කිරීමේ ගිණුම් පාස් පොත්, තැන්පත් සහතික, කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 383,299,280 ක් වූ ගිණුම් ශේෂ 14 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

(ආ) වීථි පහන් කණු විධිමත්ව අංකනය කර ඒ පිළිබඳ විස්තර දැක්වෙන ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.

(ඇ) දෛනික වැඩ වාර්තාවේ ඇතුළත් වී නොතිබුණු රු. 996,520 ක් වටිනා විදුලි පහන් 2319 ක් වීථි පහන් කණු වලට සවිකර ඇද්ද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

**1.3.6 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| ---------------------------------------- | | ----------- <br> රු. | ----------------- |
| **(අ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය <br> --------------------------- | | |
| | **II** පරිච්ඡේදයේ 13.3 වගන්තිය | - | 2016 මැයි 09 දින සිට ලේකම් තනතුරට හා 2015 සැප්තැම්බර් 16 දින සිට ශ්‍රී. ලං. තා. සේවය (විශේෂ) තනතුරට දිගු කාලීනව වැඩ බලන නිලධාරීන් පත්කර තිබුණි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි <br> ----------------------------- | | |
| (i) | මු.රෙ. 156 | 600,000 | වගකීමෙන් තොරව කටයුතු කරන නිලධාරීන් මත රජයට සිදු වන අලාභ අධිභාර කළයුතු වුවත් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා යැවීම හා දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත අධිභාර ගෙවීම නිසා සභාවට සිදු වී ඇති පාඩුව ඊට වගකිව යුතු අයගෙන් අයකර ගෙන නොතිබුණි. |
| (ii) | මු.රෙ. 371 (2) හා (5) | 497,303 | ලබාගත් අත්තිකාරම් කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද විශාල කාල ප්‍රමාදයක් සහිතව පියවා තිබූ අවස්ථා මෙන්ම වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් නොකළ අවස්ථා ද තිබුණි. |
| (iii) | මු.රෙ. 570 හා 571 | 16,523,466 | වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ. 1646 | - | සභාවට අයත් වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ඇ)** | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | - | පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |
| (ඉ) | මහා නගර සභා, නගර සභා සඳහා වූ ගිණුම් සංග්‍රහය | - | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 32,970,046 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 57,026,425 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 | (රු). '000 |
| (i) වරිපනම් හා බදු | 48,160 | 39,441 | 36,123 | 21,985 | 40,785 | 42,655 | 49,277 | 21,668 |
| (ii) කුලී | 13,750 | 19,985 | 19,410 | 2,388 | 11,674 | 12,697 | 13,333 | 875 |
| (iii) බලපත්‍ර ගාස්තු | 4,551 | 5,004 | 5,004 | - | 4,201 | 5,561 | 5,561 | - |
| (iv) වෙනත් ආදායම් | 282,965 | 284,961 | 330,555 | 232,207 | 283,764 | 287,881 | 281,708 | 282,860 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන ආදායමින් සියයට 2.73 ක් උපයාගෙන නොතිබූ අතර අයවැයගත ප්‍රාග්ධන ආදායම ඉක්මවා රු. 39,097,286 ක් හෙවත් සියයට 63.5 ක් ලැබී තිබුණි.

#### 2.2.3 වරිපනම් හා බදු

(අ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 21,686,826 ක් වූ අතර එහි රු. 50,000 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 03 කින් අයවිය යුතු රු. 292,200 ක මුදලක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට බිල්කළ වරිපනම් රු. 31,535,605 ක් වුවද ඉන් රු. 5,617,869 ක් හෙවත් සියයට 17.81 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු.20,886,247 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 7,125,395 ක් හෙවත් සියයට 34.11 ක් අයකර ගෙන තිබූ අතර රු. 13,760,852 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

**2.2.4 කුලී**

**-----**

**(අ)** සභාවට අයත් කඩ කාමර 26 කින් රු. 670,725 ක කුලියක් 2018 ජූලි 12 දිනට හිඟව පැවතුණි.

**(ආ)** 2017 වර්ෂය සඳහා බිල් කළ ආදායම වූ රු.12,593,160 කින් 2018 ජූලි 12 දින වන විටත් රු. 261,525 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2017 ජනවාරි 01 දිනට සමුච්චිත හිඟ ශේෂය රු.1,703,189 ක් වුවද ඉන් වර්ෂය තුළදී කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

**----------------**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර නිකුත් කළ යුතුව තිබූ වෙළඳසැල් සංඛ්‍යාව 1094 ක් වුවද වෙළඳසැල් 1045 කින් මුදල් අයකරගෙන තිබූ අතර වෙළඳසැල් 605 කට බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 294,075 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු මුදලින් 2018 ජූලි වන විට රු. 107,755 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට රු.955,820 ක් වූ හිඟ ව්‍යාපාර බදු ශේෂයෙන් 2018 ජූලි වන විට රු. 707,150 ක් අයකරගෙන නොතිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කාර්යසාධනය**

----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

**--------------------**

සභා බල ප්‍රදේශය තුළ ඉවතලන විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික් අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

**(ආ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

**------------------------------------**

ඇස්තමේන්තු වටිනාකම රු. 3,387,199 ක් වූ ව්‍යාපෘති 04 ක් අවලංගු කර තිබූ අතර ගිවිසුම්ගත වටිනාකම රු. 4,291,308 ක් වූ ව්‍යාපෘති 03 ක වැඩ ආරම්භ කර නොතිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**----------------------------------**

(i) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 1,903,443 ක කසළ බදු හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 793,105 ක් හෙවත් සියයට 41.67 ක් අයකර ගෙන තිබුණි.

(ii) 2017 වර්ෂය තුළ වෙන් කරන ලද කසළ ටොන් 7,117 ක් හා මිශ්‍ර කසළ ටොන් 14,539 ක් කරදියාන කසළ අංගනයට භාරදී තිබුණු අතර කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය

නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු. 10,904,250 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදුව තිබුණි.

(iii) කැස්බෑව නගර සභාව ඇතුළු පළාත් පාලන ආයතන 08 ක් කසළ බැහැර කරනු ලබන කරදියාන අපද්‍රව්‍ය අංගනය පිහිටි භූමියෙන් සියයට 80 ක භූමි ප්‍රමාණයක් කැස්බෑව නගර සභා බල ප්‍රදේශයට අයත් බැවින් සභා බල ප්‍රදේශයේ ජනතාවට ඉදිරියේ දී සෞඛ්‍ය හා පරිසර ගැටළු ඇතිවීමේ අවදානම් තත්වයක් පැවතුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

(අ) සභා බල ප්‍රදේශය තුළ ඉදිකර ඇති සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදුකර අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු පැරණි තානායම කඩා ඉවත්කර රු. 52,929,240 ක ඇස්තමේන්තුවක් යටතේ නව ගොඩනැගිල්ලක පළමු අදියර ඉදිකර 2014 දෙසැම්බර් 04 දින සභාවට භාරදී තිබූ අතර තානායමින් 2016 හා 2017 වර්ෂ සඳහා රු. 6,000,000 ක ආදායමක් අපේක්ෂා කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 02 | 02 |
| තෘතීයක මට්ටම | 02 | 01 | 01 |
| ද්විතීයික මට්ටම | 61 | 60 | 01 |
| ප්‍රාථමික මට්ටම | 184 | 174 | 10 |
| එකතුව | 251 | 237 | 14 |

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 14 ක් පිරවීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව බඳවාගෙන ස්ථිර පත්වීම් ලබා දී තිබූ සේවකයන් 48 දෙනෙකුගෙන් සේවකයන් 05 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කර නොතිබූ අතර වැටුප් වශයෙන් 2015 සිට 2017 වර්ෂය දක්වා ගෙවා තිබූ රු. 49,173,705 ක මුදල ද ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. 4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

**(අ) ඩෙංගු මර්දන වැඩසටහන**

------------------------------

පෙර වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ නිකුත් කළ රතු නිවේදන සංඛ්‍යාව 479 සිට 277 දක්වා සහ මදුරුවන් හමු වූ ස්ථාන සඳහා පවරන ලද නඩු සංඛ්‍යාව 183 සිට 118 දක්වා අඩු වී තිබුණද සභා බල

ප්‍රදේශය තුළ වාර්තා වී තිබූ රෝගීන් සංඛ්‍යාව 686 සිට 1446 දක්වා සියයට 210 කින් වැඩි වී තිබුණි. එමෙන්ම ඩෙංගු රෝග මරණ සංඛ්‍යාව 03 සිට 06 දක්වා දෙගුණ වී තිබුණි.

**(ආ) සුසාන භූමි හා ආදාහනාගාර සේවාව**

(i) හල්පිට පොදු සුසාන භූමියේ මිණුම් කටයුතු සිදු කර බිම් සැලැස්මක් සකස් කර ගැනීමට හා සුසාන භූමි 13 හි ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැටක් හෝ තාප්පයක් ඉදිකිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ii) සුසාන භූමි 03 ක මුල් මිණුම් හා සැසඳීමේ දී බිම් ප්‍රමාණය පර්චස් 37.92 ක වෙනසක් පැවතුණ අතර ආරක්ෂිත තාප්පයක් නොමැති වීමෙන් සුසාන භූමි සතු බිම් ප්‍රමාණය නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

(iii) 2015 දෙසැම්බර් 28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 06 වන වගන්තිය ප්‍රකාරව ගාස්තු ගෙවීමෙන් අනතුරුව ආදාහනාගාර භාරකරු වෙත මෘත දේහය භාර දිය යුතු වෙලාව ඇතුළත් අවසර පත්‍රයක් ඉල්ලුම්කරු වෙත නිකුත් කර නොතිබූ අතර 10 වන වගන්තිය ප්‍රකාරව ආදාහනාගාර භාරකරු විසින් අවශ්‍ය විස්තර ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

**(ඇ) පෙර පාසැල් කාර්යසාධනය**

(i) 2013 සැප්තැම්බර් 04 දිනැති අංක 1826/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර පාසැල් ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රකාරව පළාත තුළ සියළු පෙර පාසල් මේ යටතේ ලියාපදිංචි කළ යුතු වුවද එක් පෙර පාසලක් එසේ ලියාපදිංචි කර නොතිබූ අතර vii වැනි කොටස ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති ගුරුවරියන් 04 දෙනෙකු ලියාපදිංචි කර හැඳුනුම්පත් නිකුත් කර නොතිබුණි.

(ii) 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පෙර පාසැල් 04 හි ළමයින් සංඛ්‍යාව 80 සිට 60 දක්වා අඩු වී තිබූ අතර ගුරුවරු සංඛ්‍යාව 04 සිට 08 දක්වා දෙගුණ වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 පවරා නොගත් වත්කම්

(අ) කැස්බෑව නගර සභාවට අයත් අක්කර 25 පර්චස් 38.75 ක් වන සුසාන භූමි 14 ක හිමිකම (අයිතිය) සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) බාහිර ආයතන නමින් ලියාපදිංචි කර තිබූ ඩබල් කැබ් රථ 02 ක් සහ අත්ට්‍රැක්ටරයක් සභාවට පවරාගෙන නොතිබුණි.

### 3.5.2 නිශ්ක්‍රිය/ ඌන උපයෝජිත වත්කම්

(අ) වර්ෂ 01 ත් 05 ත් අතර කාලපරිච්ඡේදයක් තුළ රු. 2,256,000 ක් පිරිවැය වූ වාහන 04 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2012 පෙබරවාරි 06 දින ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් ප්‍රදානය කරන ලද අධි ධාරිතාවයෙන් යුතු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වර්ෂ 06 කට අධික කාලයක් තිස්සේ නිශ්ක්‍රීයව පැවතුණි.

### 3.5.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

2017 වර්ෂයට රු. 120,049,607 ක ස්ථාවර වත්කම් හා රු. 4,324,890 ක පොදු ගබඩා තොගය සඳහා සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.

### 3.6 හඳුනාගත් පාඩු

පාඨකයන්ට නිකුත් කරන ලද රු. 329,398 ක් වටිනා පොත් තොගයක් නැතිවූ හා ඉවත් කළ පොත් ලෙස සළකා නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ කපා හැර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

(අ) වර්ෂය තුළ ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 2.16 සිට සියයට 893.19 දක්වා විචලනයන් පැවති අවස්ථා 15 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන වියදම සියයට 5.25 ක් හා අයවැයගත ප්‍රාග්ධන වියදම සියයට 68.84 ක් වශයෙන් අයවැයගත වියදම රු.98, 453,613 කින් ඉක්මවා තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනනය

අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු විධිමත්ව සංවිධානය කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | අඩුපාඩුව |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ගිණුම්වලින් අත්හැරීම් තිබීම.<br>ii. ගිණුම්වල අඩුවෙන් හා වැඩියෙන් දැක්වීම් තිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | i. හිඟ ආදායම් අය නොවීම.<br>ii. නව ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පාලනය | i. ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොතිබීම.<br>ii. අනුමත ව්‍යාපෘති ඉටු නොකිරීම. |

| | | |
|---|---|---|
| (ඇ) | අයවැය පාලනය | i. ආදායම් ඇස්තමේන්තු තාත්වික බවකින් යුතුව පිළියෙළ නොකිරීම.<br>ii. ආදායම්, වියදම් විෂයයන්වල විශාල වශයෙන් විචලනයන් තිබීම. |
| (ඉ) | ණයගැති හා ණයහිමි පාලනය | i.හිඟ ශේෂ අය කර නොගැනීම<br>ii.ණය හිමියන් නිරවුල් නොකිරීම |
| (ඊ) | අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබීම. |
| (උ) | මානව සම්පත් කළමනාකරණය | අවශ්‍ය බඳවා ගැනිම් නිසි පරිදි ඉටු නොවීම. |
| (ඌ) | වත්කම් හා තොග පාලනය | i. වත්කම් නිශ්ක්‍රීයව පැවතීම.<br>ii. වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම.<br>iii. ස්ථාවර වත්කම් ගිණුම් ගත නොකිරීම.<br>iv. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ විධිමත් නොවීම. |